**ප්‍රතිපෝෂණ කාර්ය ප්‍රශ්ණ පත්‍ර 05**

# බුද්ධ ධර්මය



**නිපුණතා 10.3.1 10.6.1 11.6.1**

**අ.පො.ස (සා:පෙළ) උපකාරක කාර්යය පත්‍රිකා**

**ආගමික හා සාරධර්ම අධ්‍යාපන ශාඛාව,**

**අධ්‍යාපන අමාත්‍යාංශය,ඉසුරුපාය**

**බත්තරමුල්ල**

ආදර්ශ ප්‍රශ්න පත්‍ර 5

1. සීලය යන්න හඳුන්වන්න.

..........................................................................................................
..........................................................................................................

2. බුදු දහමේ දැක්වෙන සිරිත් හා විරිත් යන්නෙහි අර්ථය ලියන්න.

..........................................................................................................
..........................................................................................................
..........................................................................................................

3. සිල් රැකීමේ ආනිසංස පහ නම් කරන්න.

..........................................................................................................
..........................................................................................................
..........................................................................................................
..........................................................................................................
..........................................................................................................

4. සිල් රැකීමේ ප්‍රයෝජන පහක් ලියා දක්වන්න.

..........................................................................................................
..........................................................................................................
..........................................................................................................
..........................................................................................................
..........................................................................................................

5. විපාක දෙන ආකාරය අනුව හතරාකාර වූ කර්මය නම් කරන්න.

..........................................................................................................
..........................................................................................................
..........................................................................................................
..........................................................................................................

6. විපාක දෙන කෘත්‍යය හෙවත් කාර්යය අනුව හතරාකාර වූ කර්මය නම් කරන්න.

.................................................. .......................................................
.................................................. .......................................................

7. විපාක දෙන කාලය අනුව හතරාකාර වූ කර්මය නම් කරන්න.

1.............................................. 2.................................................
3.............................................. 4. ..............................................

8. චුල්ලකම්ම විභංග සූත්‍රයට අනුව හිස් තැනට ගැලපෙන පිළිතුර ලියා දක්වන්න.

01. අඩු ආයුෂ ඇති අය - ...............................................
02. දීර්ඝායුෂ ඇති අය - ...............................................
03. ............................................... - බහු ආබාධා
04. ............................................... - අප්පාබාධා
05. අවලස්සන අය - ...............................................
06. ............................................... - වණ්ණවන්තා
07. යසස් නැති අය - ...............................................
08. ............................................... - මහේසක්ඛා
09. අල්පභෝග ඇති දුප්පත් අය - (අප්ප භෝගා)
10. මහත් වූ භෝග ඇති පොහොසත් අය - .......................................
11. පහත් යැයි සම්මත අය - ...............................................
12. ............................................... - උච්චා කුලීනා
13. ...............................................- දුප්පඤ්ඤා
14. නුවණින් යුත් අය - ...............................................

9. කුසල , අකුසල මූල තුන ලියා දක්වන්න.

1............................................. .2....................................................

3...........................................................

10.කුසල මූල තුන ලියා දක්වන්න.

1.................................................. 2........................................................

3...........................................................

11. දස කුසල කර්ම පිළිවෙළින් ලියා දක්වන්න.

1............................................ 2.........................................................

3............................................. 4..........................................................

5............................................. 6..........................................................

7............................................. 8..........................................................

9.......................................... 10..........................................................

12 පහත කරුණු කෙටියෙන් හඳුන්වන්න.

ගති සම්පත්තිය

..........................................................................................................

..........................................................................................................

උපධි සම්පත්තිය

..........................................................................................................

කාල සම්පත්තිය

..........................................................................................................

ප්‍රයෝග සම්පත්තිය

..........................................................................................................

..........................................................................................................

ආදර්ශ ප්‍රශ්න පත්‍ර 5

පිළිතුරු

1. කය වචනය සංවර බව

2. සිරිත් යනු - කළයුතු දේ හෙවත් සමාදානය
විරිත් යනු - නොකළ යුතු දේ හෙවත් විරමණය

3. 1. මහත් වූ භෝග සම්පත් අත්පත් කර ගැනීම

2. කීර්තිය පැතිරීම

3. ඕනෑ ම පිරිසක් මැදට නිර්භය ව එළඹීම

4. සිහි මුලා නොවී කලුරිය කිරීම

5. මරණින් මතු සුගතියෙහි උපත ලැබීම

4.
- සමාජය තුළ සහජීවනය ගොඩ නැගෙයි.
- ගැටුම් සමනය වෙයි.
- තමාගේ ධනය ආරක්‍ෂාවෙයි.
- අප්‍රමාදී හා යහපත් මනසකින් කටයුතු කිරීමට හැකිවෙයි.

5. විපාක දෙන ආකාරය අනුව හතරාකාර වූ කර්මය නම් කරන්න.

1. ගරුක කර්ම
2. ආසන්න කර්ම
3. ආචිණ්ණ කර්ම
4. කටත්තා කර්ම

6. විපාක දෙන කෘත්‍යය හෙවත් කාර්යය අනුව හතරාකාර වූ කර්මය නම් කරන්න.

1. ජනක කර්ම
2. උපත්ථම්භක කර්ම
3. උපපීඩක කර්ම
4. උපඝාතක කර්ම

7. විපාක දෙන කාලය අනුව හතරාකාර වූ කර්මය නම් කරන්න.

1. දිට්ඨධම්මවේදනීය කර්ම
2. උපපජ්ජවේදනීය කර්ම
3. අපරාපරියවේදනීය කර්ම
4. අහෝසි කර්ම

8. චුල්ලකම්ම විභංග සූත්‍රයට අනුව හිස් තැනට ගැලපෙන පිළිතුර ලියා දක්වන්න.

01. අඩු ආයුෂ ඇති අය - අප්පායුකා

02. දීර්ඝායුෂ ඇති අය - දීඝායුකා

03. බොහෝ ආබාධ ඇති අය - බහු ආබාධා

04. අල්ප ආබාධ ඇති අය - අප්පාබාධා

05. අවලස්සන අය - දුබ්බණ්ණා

06. ලස්සන අය - වණ්ණවන්තා

07. යසස් නැති අය - අප්පේ සක්ඛා

08. යසස් ඇති අය - මහේසක්ඛා

09. අල්පභෝග ඇති දුප්පත් අය - අප්ප භෝගා

10. මහත් වූ භෝග ඇති පොහොසත් අය - මහා භෝගා

11. පහත් යැයි සම්මත අය - නීච කුලීනා

12. උසස් යැයි සම්මත අය - උච්චා කුලීනා

13. නුවණින් අඩු අය - දුප්පඤ්ඤා

14. නුවණින් යුත් අය - පඤ්ඤාවන්ත

9. අකුසල මූල තුන ලියා දක්වන්න.

1. ලෝභ

2. ද්වේෂ

3. මෝහ

10 කුසල මූල තුන ලියා දක්වන්න.

1. අලෝභ

2. අද්වේෂ

3. අමෝහ

11. දස කුසල කර්ම පිළිවෙළින් ලියා දක්වන්න.

1. ප්‍රාණඝාත නොකරන්නා

2. අදත්තාදානය නොකරන්නා

3. කාමමිත්‍යාචාරය නොකරන්නා

4. මුසාවාද නොකියන්නා

5. පිසුනාවාච නොකියන්නා

6. පරුෂාවාච නොකියන්නා

7. සම්පප්පලාප නොකියන්නා

8. අභිධ්‍යාව තොර වීම

9. ව්‍යාපාදය තොර වීම

10.මිත්‍යාදෘෂ්ටිය තොර වීම

12 පහත කරුණු කෙටියෙන් හඳුන්වන්න.

**ගති සම්පත්තිය**

කිසි යම් පුද්ගලයෙකු උපත ලබන්නේ යස ඉසුරින් පිරුණු ස්ථානයක නම් පෙර භවයන්හි දී සිදු කරන ලද අකුසල කර්මයන්හි විපාක දීම බොහෝ විට වැළකී යාම.

**උපධි සම්පත්තිය**

උපධි සම්පත්ති යනු උසස් රූප ශෝභාවකට හිමිකම් කීමයි.

**කාල සම්පත්තිය**

යහපත් සෞභාග්‍යවත් කාලයක් තුළ උපත ලැබීම.

**ප්‍රයෝග සම්පත්තිය**

ස්ථානෝචිත ප්‍රඥාවෙන් හා උත්සාහයෙන් කටයුතු කිරීමේ දී තමාට මුහුණ දීමට සිදු වන අකුසල කර්ම විපාක ද මගහරවා ගැනීම.



iruonline.com